# ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය 2022

01. 2022 වර්ෂයේ සිට ඡන්දහිමියන් ගණන් ගන්නා දිනය සංශෝධනය වී ඇත්ද?

**පිළිතුර**

2022 වර්ෂයේ සිට ඡන්ද හිමියන් ලියාපදිංචි කිරීමේදී සුදුසුකම් ලැබීමේ දිනය වූ ජූනි 01 දිනය වෙනුවට මින් ඉදිරියට පෙබරවාරි 01 දිනය ලෙස සංශෝධනය කර ඇත.

02. 2022 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛනයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ වයස් සීමාව කුමක්ද?

**පිළිතුර**

2022 පෙබරවාරි මස 01 දිනට වයස අවුරුදු 18 සම්පූර්ණ කළ (2004 ජනවාරි 31 හෝ ඊට පෙර උපන්) තැනැත්තන්ට 2022 පෙබරවාරි මස 01 දින සාමාන්‍ය පදිංචි ලිපිනයේ 2022 වර්ෂයේ ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වීමේ හැකියාව ඇත.

03. 2022 වර්ෂයේ ඡන්දහිමියන් ගණන් ගන්නේ කෙසේද?

**පිළිතුර**

පවතින COVID – 19 වසංගත තත්ත්වය හේතුවෙන් 2022 වර්ෂයේ ඡන්දහිමියන් ගණන් ගැනීමේ ආකෘතිපත් ගෙයින් ගෙට බෙදාදීම සිදු නොකරන අතර 2021 ඡන්දහිමි නාමලේඛනයෙන් ඉවත්වන හා 2022 වර්ෂයට ඇතුළත් කිරීමට හිමිකම් ලබන නම් ඇසුරෙන් ඡන්ද හිමි නාමලේඛන ප්‍රතිශෝධනය සිදු කෙරේ.

ඔබගේ නම 2021 ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වී ඇත්නම් 2022 වර්ෂය සඳහාද 2021 ඡන්දහිමි නාමලේඛනයේ ඔබ ලියාපදිංචිව සිටින ලිපිනය යටතේ ලියාපදිංචි කිරීම සඳහා ක්‍රියා කරනු ඇත. ඒ සඳහා ඔබ විසින් කිසිදු ආකෘතියක් සම්පූර්ණ කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බවද සලකන්න. ඔබගේ නම 2021 වර්ෂයේ ලියාපදිංචි වී නැත්නම් හෝ වයස අවුරුදු 18 සම්පූර්ණ වීම මත ප්‍රථම වරට ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වන්නේ නම් හෝ 2021 වර්ෂයේ ලියාපදිංචි ලිපිනය වෙනස් කළ යුතු වන්නේ නම් හෝ 2022 වර්ෂයේ ඡන්ද හිමියෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා **2022/ER** ආකෘති පත්‍රයක් සම්පූර්ණ කර ග්‍රාම නිලධාරී වෙත භාර දෙන්න. වැඩිදුර විස්තර 2022/ER ආකෘතියෙහිම සඳහන්ව ඇත.

05. 2021 වර්ෂයේ ඡන්දහිමි නාමලේඛන ලියාපදිංචි තොරතුරු පරීක්ෂා කර බලන්නේ කෙසේද?

**පිළිතුර**

2021 වර්ෂය සඳහා ඔබගේ නම ඡන්ද හිමියකු ලෙස ලියාපදිංචි වී ඇත්දැයි යන්න ග්‍රාම නිලධාරී කාර්යාලයේදී හා දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයේදී පරීක්ෂා කර බැලිය හැක. එසේම ඔබට www.elections.gov.lk වෙබ් අඩවිය මගින්ද මෙම තොරතුරු පරීක්ෂා කර බැලිය හැකිය.

06. මාර්ගගත ලියාපදිංචි විය හැකිද?

**පිළිතුර**

ඔව්. ඔබට www.elections.gov.lk වෙබ් අඩවිය හරහාද ඡන්දහිමි නාමලේඛනයේ ලියාපදිංචි වීම සඳහා මාර්ගගතව ඉල්ලුම් කිරීමට අවස්ථාව සළසා ඇත.

07. වයස අවුරුදු 18 සම්පූර්ණ කළ විගස ඡන්ද බලය හිමිවන ආකාරය පැහැදිලි කරන්න.

**පිළිතුර**

වයස අවුරුදු 18 සම්පූර්ණ කළ විගස පරිපූරක ඡන්ද හිමි නාමලේඛන මගින් ඡන්ද බලය ලබාදීම සඳහා නීති සම්පාදනය කර ඇත. ඒ අනුව පෙබරවාරි 01 සිට මැයි 31 දක්වා; ජූනි 01 සිට සැප්තැම්බර් 30 දක්වා; ඔක්තෝබර් 01 සිට ජනවාරි 31 දක්වා යන කාල පරිච්ඡේද තුළ වයස අවුරුදු 18 සම්පූර්ණ කරන තැනැත්තන්ගේ නම් ඇතුළත් පරිපූරක ඡන්ද හිමි නාමලේඛන සෑම මාස 4 කට වරක්ම මින් ඉදිරියට සකස් කෙරේ.

ඒ අනුව 2022.02.01 සිට 2024.01.31 දක්වා (වසර දෙකක කාලය සඳහා) වයස අවුරුදු 18 සම්පූර්ණ කරන යොවුන් පුරවැසියන් පරිපූරක ඡන්ද හිමි නාමලේඛනයට ඇතුළත් කිරීම සඳහා තොරතුරු එක්රැස් කරනු ලැබේ. ඔබ නිවසේ 2004.02.01 දින සිට 2006.01.31 දක්වා උපන් තැනැත්තෙකු සාමාන්‍ය පදිංචිය දරයි නම් (අවු: 16 – 18 දක්වා වූ) තැනැත්තාගේ විස්තර YC/2022 ආකෘතියට ඇතුළත් කර ජාතික හැඳුනුම්පතෙහි හෝ (නැතහොත් පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව නිකුත් කළ ජාතික හැඳුනුම්පත් තොරතුරු තහවුරු කිරීමේ ලිපියේ) පිටපතක් හෝ උප්පැන්න සහතිකයේ පිටපතක් හෝ සමග ග්‍රාම නිලධාරී වෙත ලබාදීමට කටයුතු කරන්න. වැඩිදුර විස්තර **YC/2022** ආකෘතියෙහි සඳහන් වේ.

08. ඡන්දහිමියෙකු ලෙස ලියාපදිංචි වීම සඳහා අවශ්‍ය ආකෘති පත්‍ර ලබා ගන්නේ කෙසේද?

**පිළිතුර**

**2022/ ER** ආකෘති සහ **YC /2022** ආකෘති පත්‍ර සියළුම ග්‍රාම නිලධාරි කාර්යාලවලින් / දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලවලින් ලබා ගත හැකි අතර මිතිවරණ කොමිෂන් සභාවේ වෙබ් අඩවියෙන්ද බා ගත කළ හැකිය.